# කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

## Performance Report

## 2012

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

அரசகரும மொழிகள் திணைக்களம்

Department of Official Languages

# කාර්ය සාධන වාර්තාව

# 2012

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
**"භාෂා මන්දිරය",**
අංක **341/ 7**
කෝට්ටේ පාර
රාජගිරිය

# පෙළගැස්ම

පිටු අංක


**01. පණිවිඩ**

i. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවුඩය 01

ii. රාජ්‍ය භාෂා කොමසාරිස්තුමාගේ පණිවුඩය 02

**02. හැඳින්වීම 03**

**03. දැක්ම හා මෙහෙවර 03**

**04. දෙපාර්තමේන්තුවේ අරමුණු 04**

**05. දෙපාර්තමේන්තුව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් 04**

**06. සංවිධාන ව්‍යුහය 05**

**07. සංවිධාන සටහන 05**

**08. අනුමත සේවක සංඛ්‍යාව 06**

**09. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ සහ එහි කාර්යභාරය**

i. පාලන අංශය 07-10

ii. ගිණුම් අංශය 11

iii. විභාග අංශය 12

iv. භාෂා විද්‍යාගාරය 13-14

v. භාෂා පරිවර්තන අංශය 14-15

vi. ප්‍රකාශන හා අලෙවි අංශය 15-17

vii. පදමාලා සම්පාදන අංශය 18

viii. පුස්තකාලය 19

**10. දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය**

10.1 ක්‍රියාකාරී සැලැස්ම - 2012 | 20-25

10.2 මූල්‍ය කාර්ය සාධන වාර්තාව - 2012 | 26

10.3 2012 වර්ෂය සඳහා ප්‍රගතිය | 27-37

10.4 විශේෂ වැඩසටහන් හා විශේෂ අවස්ථා | 38-44

**11. ඉදිරි සැලැස්ම - 2013 | 45-49**

**12. දුරකතන නාමාවලිය | 50**

## ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශ ලේකම්තුමියගේ පණිවුඩය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ ත්‍රිභාෂා දස අවුරුදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රජයේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා 2012 වර්ෂය තුළ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් මහඟු දායකත්වයක් ලබාදෙන ලදි.

ද්විභාෂාවෙන් සහ ත්‍රිභාෂාවෙන් කටයුතු කිරීමේදී භාෂා පරිවර්තක සේවයේ අත්‍යවශ්‍යතාවය හඳුනාගනිමින්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් භාෂා පරිවර්තක සේවය ලබාදීම ආයතනයේ ප්‍රධාන කර්තව්‍යයක් වශයෙන් ඉටුකිරීම ඉතා අගය කරමි. පාරිභාෂික පදමාලා සම්පාදනය, ත්‍රිභාෂා ශබ්ද කෝෂය සම්පාදනය කිරීම හා භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීමද ඒ හා සමාන වැදගත්කමක් සහිත කාර්යයන් ලෙස දකිමි. එමෙන්ම, රාජ්‍ය නිලධාරින්ගේ මෙන්ම සියලු පුරවැසියන්ගේ භාෂා අවශ්‍යතාවයන් සපුරාලීමේදී මෙම වැඩසටහන් මහත්සේ උපකාර වී ඇත. තව ද, ත්‍රිභාෂා ශබ්ද කෝෂය හා භාෂා පරිවර්තක සංචිතය අන්තර් ජාලයට එක්කිරිමද, ආයතනය මගින් 2012 වර්ෂයේ ලබාගත් ජයග්‍රහණයක් ලෙසත්, කාලීන අවශ්‍යතාවයක් ඉටුකිරිමක් ලෙසත් දකිමි.

2013 වර්ෂයේදී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය වඩාත් කාර්යක්ෂමව සහ පුළුල් ආකාරයෙන් ඉටුකිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, මහා භාණ්ඩාගාරය මගින් වෙන්කරන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩිකිරිම ද ආයතනය ලබාගත් ප්‍රගතියක් ලෙස සලකමි. ඒ අනුව 2013 වසරේදී දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති විශාල වගකීම ඉතා හොඳින් අවබෝධ කොට ගෙන මානව සම්පත් වැඩිකර ගැනිමටත්, දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීමටත්, සැලසුම් කර ඇති බව සඳහන් කරන්නේ ඉතා සතුටිනි.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් සාර්ථකව ඉටුකිරීම සඳහා දායකත්වය සැපයූ කොමසාරිස්තුමා ඇතුළු සියලුම නිලධාරින්ට මාගේ ස්තුතිය සහ ප්‍රශංසාව පිරිනමන අතර, 2013 වසරේදී වඩාත් සාර්ථකව ආයතනයේ මෙහෙවර ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

එම්.එස්.වික්‍රමසිංහ

ලේකම්

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

## රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන විපර්යාසයන්ට සමගාමීව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ද ක්‍රමික වෙනස්කම්වලට භාජනය විය.දශක තුනකට අධික කාලයක් පැවති ජනවාර්ගික අර්බුදයේ ප්‍රතිඵලයක් වූ කුරිරු යුද්ධයේ ආදීනව සමස්ත ජාතියම අත්විඳ තිබුණි. එමනිසා රටේ ජාතික අවශ්‍යතාවය වූයේ ස්ථිරසාර සාමය හා ජනවාර්ගික සංහිඳියාවයි.

2009 වසරේ මිලියන දෙකකට ආසන්න ජනතාවගේ අනාගත සුබසිහින යථාර්ථයක් බවට පත්කරවමින් දිනූ රටට තිරසාර සාමයක් සහ ශක්තිමත් හෙට දිනක් තැනීමට නම් ත්‍රිභාෂා දැනුම සෑම ශ්‍රී ලාංකිකයෙක්ම සතු වියයුතු බව අවධාරණය වීය. ඒ අනුව 2012 වසර "ත්‍රිභාෂා වර්ෂය" ලෙස ප්‍රකාශයට පත් කෙරුණු අතර, ඒ වෙනුවෙන් දස අවුරුදු වැඩ පිළිවෙලක් 2012.01.21 දින එළි දක්වන ලදි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ සෘජු වගකීම පැවරී ඇති ආයතනයක් වශයෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2012 වසර තුළ විශාල කාර්යභාරයක් ඉටු කරනු ලැබිණි. එහිදී මනා අවබෝධයකින් හා හැඟීමකින් ක්‍රියාකරන, ප්‍රායෝගික දේශපාලන නායකත්වයක් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍යතුමාගෙන් ලද බව සඳහන් කරනුයේ ගෞරවයෙනි. එසේම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට පැවරී ඇති භාරදූර කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමියගෙන් ලද මඟපෙන්වීම සහ අනුග්‍රහය අප දෙපාර්තමේන්තුවට ඉමහත් ශක්තියකි.

විශේෂයෙන් රජයේ නිල භාෂා පරිවර්තකයා ලෙසත්, රාජ්‍ය නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා ඇගයුම්කරු ලෙසත්, භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට උපකාරි වන්නාවූ නොයෙකුත් ප්‍රකාශන හා අත්පොත් සම්පාදකයා ලෙසත්, නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ විෂය මාලා සංවර්ධනය කරන්නෙකු ලෙසත් 2012 වසර තුළ අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමට මාහට හැකිවූයේ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ලද නොමඳ සහයෝගය නිසාවෙනි. එසේම වසර තුළ ඉටු කළ කාර්යයන් සහ එහි ප්‍රගතිය එළිදැක්වීමට ලැබීම සතුටක් වන අතර, එය සැකසීම සඳහා දායක වූ සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතියත් සමස්ථ කාර්ය මණ්ඩලයට කෘතඥතාවයත් පළ කරමි.

ජේ.ඩී.සී. ජයසිංහ

රාජ්‍ය භාෂා කොමසාරිස්

## 02. හැදින්වීම

1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස 1956.10.01 දින රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. 1987 – 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1988-16 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව සිංහල හා දෙමළ භාෂා දෙකම ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා බවට පත් කෙරුණු අතර, ඉංග්‍රීසි සන්ධාන භාෂාව ලෙස නම් කෙරිණි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ 18 හා 19 වන ව්‍යවස්ථාවල සඳහන් වන පරිදි භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දැනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පහසුකම් සලසන්නා ලෙස කටයුතු කරන අතර, ඒ අනුව ඉහත සඳහන් භාෂා තුනට අදාළ පර්වර්තන කටයුතු රජයට සපයාදීමත්,රාජ්‍ය සේවකයන්ගේ භාෂා නිපුණතා වැඩිදියුණු කිරීමත්, පාරිභාෂික ශබ්දමාලා සකස් කිරීමත්,භාෂාව පිළිබඳ පෙළ පොත් සහ ශබ්ද කෝෂ සම්පාදනය කිරීමත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

වර්තමානයේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් හොබවනු ලබයි. “භාෂා මන්දිරය”,අංක 341/7, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයේ දෙපාර්තමේන්තුව පිහිටා ඇත.

## 03. දැක්ම හා මෙහෙවර

### දැක්ම

සහජීවනයෙන් පිරිපුන් සාමකාමී ත්‍රෛභාෂික සමාජයක්

### මෙහෙවර

ජනවාර්ගික සමගිය හා සාමය අරමුණු කරගත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය

## 04. දෙපාර්තමේන්තුවේ අරමුණු

1. ත්‍රෛභාෂික (සිංහල, දෙමළ,ඉංග්‍රීසි) කුසලතා හා වෙනත් විදේශීය භාෂා කුසලතා වර්ධනය කරගැනීම සඳහා රජයේ නිලධාරීන්ට සහ භාෂා හදාරන්නන්ට පහසුකම් සැලසීම.

2. රජයේ ආයතනවල නිල පරිවර්තකයා වශයෙන් කටයුතු කිරීම.

3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සලසනුවස් විවිධ විෂයන් සඳහා පදමාලා සම්පාදනය.

## 05. දෙපාර්තමේන්තුව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2007 හා 07/2007 පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගැනීමට නියමිත නිලධාරින් සඳහා අදාල ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම
හා සහතිකපත් නිකුත් කිරීම.

2. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල පරිවර්තන කාර්යයන් ඉටුකිරිම.

3. විවිධ විෂයයන් සඳහා සිංහල - ඉංග්‍රීසි හා ඉංග්‍රීසි -දෙමළ පාරිභාෂික පදමාලා සම්පාදනය කිරිම.

4. රජයේ නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා විභාග සඳහා වන පෙළ පොත්, ආධාරක ග්‍රන්ථ සම්පාදනය කිරීම

5. ත්‍රිභාෂා ශබ්ද කෝෂයන් සැකසීම

6. නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මෙන්ම ජාත්‍යන්තර භාෂා, භාෂා විද්‍යාගාරයක් තුළ දී ඉගැන්වීම හා විභාග පැවැත්වීම

7. බාහිර ආයතනවල කාර්ය මණ්ඩල සඳහා භාෂා ප්‍රවීණතා විභාග හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විම

8. විශ්වවිද්‍යාල හා පිළිගත් අධ්‍යාපනික ආයතනවල භාෂා පරිවර්තන පාඨමාලා හදාරන්නන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම

## 06. සංවිධාන ව්‍යුහය

දෙපාර්තමේන්තු කාර්ය භාරයේ ස්වභාවය අනුව පහත සඳහන් අංශවලට බෙදා ඇත.

I. පාලන අංශය
II. ගිණුම් අංශය
III. විභාග අංශය
IV. භාෂා පරිවර්තන අංශය
V. භාෂා විද්‍යාගාරය
VI. ප්‍රකාශන හා අළෙවි අංශය
VII. පදමාලා සම්පාදන අංශය
VIII. පුස්තකාලය

## 07. සංවිධාන සටහන



## 08. අනුමත සේවක සංඛ්‍යාව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | 2012.12.31 දිනට පුරප්පාඩු |
|---|---|---|---|
| රාජ්‍ය භාෂා කොමසාරිස් | 01 | 01 | - |
| නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් | 03 | 02 | 01 |
| ගණකාධිකාරී | 01 | - | 01 |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| පරිවර්තන අධිකාරි | 03 | - | 03 |
| භාෂා විද්‍යාගාර අධිකාරි | 01 | - | 01 |
| භාෂා පරිවර්තක | 15 | 06 | 09 |
| භාෂා පරිවර්තක සහකාර | 79 | 79 | - |
| ව්‍යාපෘති සංවර්ධන සහකාර | 20 | 18 | 02 |
| පුස්තකාලයාධිපති | 01 | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 16 | 14 | 02 |
| භාෂා විද්‍යාගාර සහකාර | 01 | 01 | - |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 01 | 01 | - |
| කාර්යාල සේවක සේවය | 10 | 08 | 02 |
| රියැදුරු | 02 | 02 | - |

## 09. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා එහි කාර්යභාරය

### I. පාලන අංශය

දෙපාර්තමේන්තුවේ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මානව හා භෞතික සම්පත් ඵලදායීව මෙහෙයවීම සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමත් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධති නඩත්තු කිරීම හා අන්තර්ජාලය හා වෙබ් අඩවි ආශ්‍රිත කටයුතු මෙහෙයවීමත් මෙම අංශයෙන් සිදුකෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ.

### 2012 වසරේ ක්‍රියාකාරකම්

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සංශෝධනය කරන ලද පහත සඳහන් දෙපාර්තමේන්තුගත තනතුරු 04 සඳහා බඳවා ගැනීමේ පරිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

-පරිවර්තන අධිකාරී
-භාෂා විද්‍යාගාර අධිකාරී
-භාෂා පරිවර්තක
-භාෂා විද්‍යාගාර සහකාර

මෙම තනතුරු අතරින් පරිවර්තන අධිකාරී, භාෂා විද්‍යාගාර අධිකාරී, භාෂා පරිවර්තක තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට හැකිවිය.

ii. රජයේ ප්‍රතිපත්තිය මත උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික් මට්ටමින් දෙපාර්තමේන්තුවට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් 54 දෙනෙකු පහත සඳහන් ක්ෂේත්‍රවලට අනුයුක්ත කර පුහුණුව ලබාදෙන ලදී.

- භාෂා පරිවර්තන (සිංහල/ඉංග්‍රීසි) (සිංහල/දෙමළ)
- භාෂා ප්‍රවීණතා විභාග සම්බන්ධීකරණය
- භාෂා විද්‍යාගාරයේ භාෂා පන්ති සම්බන්ධීකරණය
- පාලන / ගිණුම් හා සංවර්ධන කටයුතු
- තොරතුරු තාක්ෂණ කටයුතු

iii. සංවර්ධන නිලධාරී තනතුරු 93 ක් ඇතිකිරීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට මු.රෙ. 71 ඉදිරිපත්කරන ලදී.

iv. කළමනාකරණ ප්‍රතිසංස්කරණ සංසද

රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මගපෙන්වීම මත කාර්යයන් හා ක්‍රියා පටිපාටි සමාලෝචනය සඳහා කළමනාකරණ ප්‍රතිසංස්කරණ සංසද ස්ථාපිත කරන ලදී.

ඒ යටතේ, දෙපාර්තමේන්තුව සඳහා පත්කර සිටින උපදේශක එස්.ඒ.මනම්පේරි මහතා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව

ක්‍රම විධි හා ක්‍රියා පරිපාටි සංවර්ධනය කිරීම මගින් දෙපාර්තමේන්තුව විසින් සලසනු ලබන සේවාවන් වඩාත් ගුණාත්මක හා සඵලදායී කිරීම, එමෙන්ම ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා පාරිභාෂික පදමාලා සම්පාදනය ස්ථිර කායීභාරයක් බවට පත්කිරීමටත , භාෂා හා භාෂණ පරිවර්තන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමටත්,තොරතුරු තාක්ෂණ ශක්‍යතාව වර්ධනය කිරීමටත්,රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ පර්යේෂණ ,සැලසුම් සහ ව්‍යාපෘති කටයුතු මෙහෙයවීම සඳහාත් පහත සඳහන් තනතුරු අනුමත කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

- සහකාර කොමසාරිස් (ශාස්ත්‍රීය) - 01
- පරිභාෂාවේදී - 06
- ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ II ශ්‍රේණිය -02
- භාෂණ පරිවර්තන (සිංහල/ඉංග්‍රීසි),(සිංහල/දෙමළ),(දෙමළ/ඉංග්‍රීසි)

v. වසර ගණනක් පුරප්පාඩුව පැවති පරිපාලන නිලධාරී තනතුර පිරවීම මෙම වර්ෂයේදී සිදුවූ සුවිශේෂී සිදුවීමකි.

vi. ජාතික ඵලදායිතා සම්මාන 2010/2011 තරගාවලියට අයදුම්පත් ඉදිරිපත් කරන ලද අතර එහි ශ්‍රේණිගත කිරීම අනුව E ශ්‍රේණියේ ආයතනයක් ලෙස ශ්‍රේණිගත කෙරිණි.

vii. පදමාලා සම්පාදන ව්‍යාපෘතිය සඳහා පහත පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා දත්ත ක්‍රියාකරුවන් වසරක කාලයකට බඳවාගන්නා ලදී.

සිංහල/ඉංග්‍රීසි පදමාලා අංශය- අධ්‍යක්ෂ - 01,දත්ත සටහන් ක්‍රියාකරුවන් - 02

දෙමළ /ඉංග්‍රීසි පදමාලා අංශය - අධ්‍යක්ෂ - 01,දත්ත සටහන් ක්‍රියාකරුවන් - 02

viii. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී කරවීම නිසා එම නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය වූ අතර, ආයතනයේ ඵලදායීතාව ඉහළ යාම සඳහා එය බෙහෙවින් ඉවහල් විය.

- රාජ්‍ය ආයතනවල විගණන ප්‍රශ්න අවම කර ගැනීම
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන
- ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වෙනුවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ක්‍රියාත්මක කිරීම
- විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම
- රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ සේවාරම්භක පුහුණුව
- ලේඛන කළමනාකරණය
- පරිගණක පාඨමාලා
- ලේඛනකරණ කුසලතා වර්ධනය
- දූරකතන ක්‍රියාකරුවන්ගේ කුසලතා වර්ධනය
- රියදුරන් සඳහා ප්‍රායෝගික පුහුණුව
- ගබඩාකරණය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- Kizen Management
- Essence of Public Procurement
- කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධනය
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම,ආයතන සංග්‍රහය, මූල්‍ය ක්‍රම සහ වැටුප් සැකසීම හා පරිවර්තනය පිළිබඳ පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම

ix. භාෂණ පරිවර්තන සංචිතයක් ඇතිකිරීම, එම සංචිතය වෙබ් අඩවියට මුදාහැරීම සහ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින්ගේ නම් වෙබ් අඩවියේ පළකිරීම යන විශේෂ කාර්යයන්ද ඉටුකරනු ලැබිණි.

X. භාවිතයෙන් ඉවත්කර තිබූ 61-1179 වැන් රථය ටෙන්ඩර් කර විකිණීම සහ මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ NB 3466 වැන් රථය අලුතෙන් ලබාගැනීමට කටයුතු කරන ලදී.

xi. දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කරන ලදී.

xii. 2012 වසර තුළ ඉටුකළ නඩත්තු කටයුතු පිළිබඳ විස්තර පහත පරිදිය.

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | මුදල රුපියල් | ශත |
|---|---|---|---|---|
| 2012.07.27 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තීන්ත ආලේප කිරීම | 301042 | 470162 | 00 |
| 2012.12.26 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තීන්ත ආලේප කිරීම | 220395 | 940324 | 00 |
| 2012.12.31 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තීන්ත ආලේප කිරීම | 301057 | 47218 | 00 |
| | | | 1457704 | 00 |
| 2012.03.13 | වැසිකිලිවල අපද්‍රව්‍ය ඉවත්කිරීම | | 8725 | 00 |
| 2012.05.14 | දොරටුවල යතුරු සවිකිරීම | | 1000 | 00 |
| 2012.05.17 | දෙපාර්තමේන්තුවේ ජලකරාම මිලදී ගැනීම | | 1200 | 00 |
| 2012.06.13 | ගොඩනැගිල්ලේ විදුලි වැඩ සම්බන්ධ නඩත්තු කයයුතු | | 2000 | 00 |
| 2012.12.12 | පාලන අංශයට උපකරණ මිලදී ගැනීම | | 3998 | 40 |
| 2012.12.26 | වැසිකිලි අලුත්වැඩියාව | | 128241 | 63 |
| | | 301041 | | |
| | | 256347 | | |
| | | | 145165 | 03 |

xiii. සංවර්ධන අංශය යටතේ 2012 වර්ෂය තුලදී පහත කාර්යයන් ඉටු කරනු ලැබිණි.

- මාසික ඉදිරි වැඩසටහන් නියමිත දිනයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම
- මාසික,කාර්තුමය ,අර්ධ වාර්ෂික හා වාර්ෂික ප්‍රගතිය නියමිත කාලය තුළ අමාත්‍යාංශයට හා අදාල අනෙකුත් ආයතනවලට ඉදිරිපත් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම හා ප්‍රගතිය පවත්වාගෙන යාම.
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව සැකසීම හා ඉදිරිපත්කිරීම.
- අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරී රැස්වීම් වාර්තා මෙහෙයවීම.
- පොත් ගබඩාවේ කටයුතු මෙහෙයවීම.

## II. ගිණුම් අංශය

දෙපාර්තමේන්තු සියලුම මූල්‍ය කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම මෙම අංශයෙන් සිදුකෙරන ප්‍රධාන කාර්යභාරය වේ.දෙපාර්තමේන්තුව සඳහා වෙන්වන වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනවලට යටත්ව සාමාන්‍ය පරිපාලනයට අදාල වැටුප් ගෙවීම වැනි කාර්යයන් සඳහා ප්‍රතිපාදන වියදම් කිරීමත් දෙපාර්තමේන්තුවේ මූලධන ව්‍යාපෘති වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමත් මේ යටතේ සිදුවේ . මනා මූල්‍ය පාලනයකින් යුතුව ඉහත ඉහත කාර්යයන් ඉටුකිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට හා අදාල අනෙකුත් ආයතන වලට වාර්තා කිරීම හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කිරීමද සිදුකරනු ලැබිණි.එමෙන්ම වාර්ෂික භාණ්ඩ හ බඩා සම්බන්ධ කටයුතු සමීක්ෂණ කටයුතු ද වර්ෂය තුළ ඉටුකරන ලදී.

### වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන - 2012

| කේත අංකය | විස්තරය | මුළු සැපයුම |
|---|---|---|
| 236-1-1-0-1001 | වැටුප් හා වේතන | 36605000.00 |
| 236-1-1-0-1002 | අතිකාල හා නිවාඩු දින දීමනා | 500000.00 |
| 236-1-1-0-1003 | වෙනත් දීමනා | 13895000.00 |
| | පුද්ගලික දීමනා | 51000000.00 |
| 236-1-1-0-1101 | ගමන් වියදම් - දේශීය | 196000.00 |
| 236-1-1-0-1102 | ගමන් වියදම් - විදේශීය | 403000.00 |
| 236-1-1-0-1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 980000.00 |
| 236-1-1-0-1202 | ඉන්ධන | 490000.00 |
| 236-1-1-0-1203 | ආහාර හා නිළ ඇඳුම් | 49000.00 |
| 236-1-1-0-1301 | වාහන නඩත්තු | 212000.00 |
| 236-1-1-0-1302 | යන්ත්‍ර හා උපකරණ නඩත්තුව | 147000.00 |
| 236-1-1-0-1303 | ගොඩනැගිලි හා ව්‍යුහ නඩත්තු | 2470000.00 |
| 236-1-1-0-1402 | තැපැල් හා සන්නිවේදන සේවා | 784000.00 |
| 236-1-1-0-1403 | විදුලි හා ජලය | 1862000.00 |
| 236-1-1-0-1404 | බදු කුලී හා දේශීය බදු | 490000.00 |
| 236-1-1-0-1405 | විවිධ | 3450000.00 |
| 236-1-1-0-1506 | දේපළ ණය පොළිය - රාජ්‍ය සේවකයන් සඳහා | 1345000.00 |
| | විවිධ පුනරාවර්තන | 12666000.00 |
| | මුළු පුනරාවර්තන | 63666000.00 |
| 236-1-1-0-2001 | ගොඩනැගිලි නව්‍යකරණය හා සංවර්ධනය කිරීම | 455000.00 |
| 236-1-1-0-2002 | යන්ත්‍ර හා උපකරණ නව්‍යකරණය හා සංවර්ධනය කිරීම | 182000.00 |
| 236-1-1-0-2003 | වාහන නව්‍යකරණය හා සංවර්ධනය කිරීම | 182000.00 |
| 236-1-1-0-2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ ලබා ගැනීම | 910000.00 |
| 236-1-1-0-2103 | යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | 182000.00 |
| 236-1-1-0-2401 | මානව සම්පත් සංවර්ධනය | 91000.00 |
| 236-1-1-0-2502 | සම්පත් සංවර්ධනය | 11183000.00 |
| | මුළු ප්‍රාග්ධනය | 13185000.00 |
| | මුළු එකතුව | 76851000.00 |
| 134-2-3-3-2502 | පෙළ පොත් මුද්‍රණය | 4991360.00 |
| 134-2-3-1-2502 | පරිවර්තන පුහුණුව | 131000.00 |

## III. විභාග අංශය

රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා දීප ව්‍යාප්තව භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම මෙම අංශයෙන් සිදුකෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ.

### 2012 වසරේ ක්‍රියාකාරකම්

රජයේ නිලධාරීන්ගේ භාෂා කුසලතාවය තක්සේරු කිරීම හා ත්‍රිභාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා දිරිගැන්වීම අරමුණු කරගනිමින් විභාග පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම හා සහතිකපත් ප්‍රදානය සිදුකරනු ලබයි. ඒ අනුව විභාග අංශය විසින් 2012 වර්ෂය තුළදී ඉටුකරන ලද කාර්යයන් පහත පරිදිය.

i. 2011.05.28 දින වාචික පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ හෝ ඊට පෙර වසරවල වාචික පරීක්ෂණවලට පෙනී සිටීමට නොහැකි වූ හෝ අසමත් වූ හෝ නිලධාරීන් 2205ක් සඳහා 2012.01.22 දින වාචික පරීක්ෂණයක් පවත්වන ලදි.

ii. 2011.10.29 දින පැවැති ලිඛිත විභාගය (I / II මට්ටම) සමත් රාජ්‍ය නිලධාරීන් 1754ක් සඳහා වාචික පරීක්ෂණය 2012.09.24 සිට 2012.09.27 දක්වා පවත්වන ලදි.

iii. සිංහල/දෙමළ III මට්ටම සමත් නිලධාරීන් 8446ක් සඳහා 2012.11.03 දින සිට 2012.11.30 දින දක්වා කාලය තුළ වාචික පරීක්ෂණය පවත්වන ලදි.

iv. සහතිකපත් 3141ක් තැපෑලෙන් යවන ලදි.

v. සමාජ ඒකාබද්ධ සතිය වෙනුවෙන් දකුණ (510) හා සබරගමුව (361) පළාත්වල සහතික 871ක් උත්සවාකාරයෙන් ප්‍රදානය කරන ලදි.

vi. අම්පාර දිස්ත්‍රික්කයේ නිලධාරීන් 481 සඳහා 2012.10.23 දින සහතිකපත් ප්‍රදානය කරන ලදි.

vii. මඩකලපුව, ත්‍රිකුණාමලය, හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල සහතික 1484 ක් දැයට කිරුළ සමගාමී වැඩසටහන් යටතේ ප්‍රදානය කිරීමට සූදානම් කරනලදි.

viii. භාෂා කුසලතාව තක්සේරු කිරීම හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම තුලින් සපුරාලියයුතු වෘත්තීමය දැනුම පිළිබඳ තක්සේරුවක් ලබා දීම අරමුණු කරගනිමින් බාහිර ආයතනවල ඉල්ලීම පරිදි සඳහා විභාග පැවැත්වීම.මෙහිදී ආයතන 08ක් සඳහා විභාග පවත්වන ලද අතර, පෙනී සිටි සංඛ්‍යාව 1001 කි

## IV. භාෂා විද්‍යාගාරය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දේශීය හා විදේශීය භාෂා පන්ති සම්බන්ධීකරණය මෙම අංශයෙන් සිදුකෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ.

**2012 වසරේ ක්‍රියාකාරකම්**

දේශීය හා විදේශීය භාෂා පිළිබඳ කුසලතාවය වැඩිදියුණු කිරීම, ජාතීන් අතර භාෂාමය වශයෙන් පවත්නා අවහිරතා ඉවත් කිරීම තුළින් සමගිය හා සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම අරමුණු කරගනිමින් 2012 වර්ෂය තුළදී භාෂා විද්‍යාගාරය හරහා පහත කාර්ය භාරයන් සිදුවිය.

i. 2012 පළමු අර්ධ වාර්ෂිකයේ සිසුන් 482ක් සඳහා 2012.01.09 දින සිට භාෂා පාඨමාලාවන් ආරම්භ කිරීම.

ii. භාෂා විද්‍යාගාරයේ නවීකරණ කටයුතු අවසන් කොට භාෂා ඉගෙනුම් උපකරණ භාවිතය හා භාෂා විද්‍යාගාරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ වැඩමුළුවක් 2012.01.25 වන දින පැවැත්වීම.

iii. 2012 පළමු අර්ධ වාර්ෂිකය සඳහා පුරප්පාඩුව පැවති භාෂා උපදේශකවරුන් තිදෙනෙකු 2012.01.10 දින බඳවා ගැනීම.

iv. 2012 භාෂා පාඨමාලාවන්හි විෂය නිර්දේශය සහ භාෂා පාඨමාලාවන් ඉගැන්වීමේදී මතුවන ගැටලු පිළිබඳ උපදේශකවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.

v. දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ මොබිටෙල් ආයතනය සමග මූලික සාකච්ඡාවක් 2012.01.30 දින පැවැත්වීම.

vi. 2012 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දී භාෂා විද්‍යාගාරයේ කාර්යභාරය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ භාෂා විද්‍යාගාරයේ ආකෘතියක් මගින් මහජනයා දැනුවත් කිරීම.

vii. 2011 වසරේ භාෂා පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන් සඳහා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2012.03.19 දින සහතිකපත් ප්‍රදානය කිරීම.

viii. නවීන තාක්ෂණික උපකරණ භාවිත කොට නවීකරණය කරන ලද භාෂා විද්‍යාගාරය 2012.03.19 දින නැවත විවෘත කිරීම.

ix. භාෂා විද්‍යාගාරයේ ප්‍රායෝගික වැදගත්කම හා ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගුරු පුහුණු වැඩසටහනක් 2012.03.19 වන දින උපදේශකවරුන් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදුකිරීම.

x. දුරස්ථ අධ්‍යාන ක්‍රමවේදයට අදාළ මූලික පාඩම් සකස් කිරීම හා එහි ඉදිරි කටයුතු සංවිධානය කිරීම සම්බන්ධව මොබිටෙල් ආයතනය සමග සාකච්ඡාව පැවැත්වීම.

xi. 2012 පළමු අර්ධ වාර්ෂිකයේ භාෂා පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් සඳහා වාචික හා ලිඛිත අවසාන පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

xii. භාෂා පාඨමාලාවන්හි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන විෂයන්ට අදාළ වන විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම සඳහා විෂයභාර උපදේශකවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.

xiii. 2012 දෙවන අර්ධ වාර්ෂිකයෙහි භාෂා පාඨමාලාවන්හි මතුවන ගැටලු හා ඊට අදාළ විසඳුම් පිළිබඳ උපදේශකවරුන් සමඟ 2012.10.02 දින සාකච්ඡාවක් පැවැත්වීම.

xiv. 2012 පළමු අර්ධ වාර්ෂිකයේ භාෂා පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් 387 දෙනෙකු සඳහා 2012.10.20 දින උත්සවාකාරයෙන් සහතිකපත් පිරිනැමීම.

xv. 2013 පළමු අර්ධ වාර්ෂිකයට සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම පළ කිරීම.

xvi. දෙවන අර්ධ වාර්ෂිකයේ දෙමළ භාෂාව හැදෑරූ සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් පැවත්වීම.

xvii. 2012 දෙවන අර්ධ වාර්ෂිකයේ භාෂා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් සඳහා අවසාන පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

xviii. පුවත්පත් දැන්වීමක් මඟින් 2013 වසරේ පළමු අර්ධ වාර්ෂිකයට අදාළව සිසුන් ලියාපදිංචි කර ගැනීම.

## V. භාෂා පරිවර්තන අංශය

රජයේ නිල භාෂා පරිවර්තන කටයුතු ඉටුකිරීම මෙම අංශයෙන් සිදුකෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ.

### 2012 වසරේ ක්‍රියාකාරකම්

දිවයිනේ ඕනෑම ප්‍රදේශයකදී අවශ්‍ය භාෂා පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවා ලබාගැනීමට හැකි වන අයුරින් භාෂා පරිවර්තන සේවාවන් සැපයීම අරමුණු කරගනිමින් 2012 වර්ෂයේදී පහත සඳහන් කාර්යභාරය මෙම අංශය මඟින් ඉටුකරන ලදී.

**i.** භාෂා පරිවර්තන සංචිතය යාවත්කාලීන කිරීම හා එම විස්තර වෙබ් අඩවියට මුදාහැරීම.

**ii.** භාෂණ පරිවර්තන සංචිතය ස්ථාපිත කිරීම.මෙම සංචිතය සඳහා තෝරාගත් 109 දෙනා අතරින් 40 දෙනෙකුගේ විස්තර වෙබ් අඩවියට මුදාහැර ඇත. (කෙටි පුහුණුවකින් පසු ඉතිරි අයගේ විස්තරද වෙබ් අඩවියට මුදා හැරීමට තීරණය කර ඇත).

**iii.** භාෂා පරිවර්තන ඒකකය ස්ථාපිත කිරීම.ජාතික භාෂා ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ භාෂා පරිවර්තන ඒකකය ස්ථාපිත කිරීමේ මූලික කටයුතු ආරම්භකරන ලදී.

**iv.** භාෂා පරිවර්තනය සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් පුහුණු කිරීම.සිංහල/දෙමළ සහ දෙමළ/ඉංග්‍රීසි භාෂා පරිවර්තන කටයුතු සඳහා භාෂා ප්‍රවීණතාවය සහිත උපාධිධාරී අභ්‍යාසලාභීන් 30ක් හඳුනා ගන්නා ලද අතර සිංහල/දෙමළ භාෂා පරිවර්තනය සම්බන්ධයෙන් මාස 1 ½ ක කෙටි කාලීන පුහුණුවක් ලබාදෙන ලදී.

## VI. ප්‍රකාශන හා අලෙවි අංශය

රාජ්‍ය නිලධාරින් ඇතුළුව භාෂා හදාරන්නන් හට අවශ්‍යවන පාඨ ග්‍රන්ථ හා භාෂා අභ්‍යාස පොත් සම්පාදනය කිරීම හා මුද්‍රණය කර අලෙවි කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### 2012 වසරේ ක්‍රියාකාරකම්

i. ග්‍රන්ථ අතුරින් විශේෂයෙන් දෙමළ හා සිංහල භාෂාව හැදෑරීමට උපකාරීවන ලේඛන දෙමළ පොත් 5000 ක් හා කථන දෙමළ පොත් 14,900 ක් මුද්‍රණය කර නිකුත් කිරීමත්, භාෂණ සිංහල පොත පිටපත් 3000 ක් මුද්‍රණය කිරීම හා ඉන් පොත් 274 ක් අලෙවි කිරීමත් සිදුකරන ලදී.වසර තුළදී පොත් අලෙවියෙන් රජයට බැර කළ මුදල රු.46,45,170.00 කි.

ii. ත්‍රිභාෂා හදාරන්නන්හට බෙහෙවින් ප්‍රයෝජනවත් මෙන්ම පහසුවෙන් පරිහරණය කළ හැකි වීමේ අරමුණින් ත්‍රිභාෂා ශබ්ද කෝෂය සැකසීම හා මුද්‍රණය **ප්‍රකාශන හා අලෙවි අංශය හරහා සිදුවේ.ඒ යටතේ** සිංහල ශීර්ෂ වචන සහිත වචන 26 000 කින් යුත් ත්‍රිභාෂා ශබ්දකෝෂයේ මුල්පිටපත 2012.03.21 දින අරලියගහ මන්දිරයේදී අතිගරු ජනාධිපතිතුමාට පිරිනමන ලදී. FLICT ආයතනයේ අනුග්‍රහය ඇතිව එම ශබ්ද කෝෂය 2012.07.16 දින අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් අරලියගහ මැදුරේදී අන්තර්ජාලයට එක්කරනලදී. මෙහි දෙවන පියවරක් ලෙස දෙමළ ශීර්ෂ වචන සහිත වචන 30000 කින් සමන්විත ශබ්දකෝෂය උච්චාරණය හා අදාල තැන්වල චිත්‍ර ආශ්‍රයෙන් විධිමත් ශබ්දකෝෂයක් ලෙස අන්තර්ජාලයට එක් කරමින් පවතී. බාහිර ආයතනයක අනුග්‍රහය ඇතිව ඉදිරියේදී මුද්‍රණය කිරීමට අපේක්ෂිතය

| 2012 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දක්වා ප්‍රකාශන අලෙවි අංශයේ ආදායම | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | ප්‍රකාශනය | අලෙවි ඒකක ගණන | ඒකකයක මිල රු. | වටිනාකම රු. |
| 01 | මූලික සිංහල | 307 | 25 | 7675 |
| 02 | භාෂණ සිංහල | 274 | 180 | 49320 |
| 03 | සිංහලෙන් දෙමළ | 1547 | 180 | 278460 |
| 04 | කථන දෙමළ | 14060 | 200 | 2812000 |
| 05 | ලෙඛන දෙමළ | 5007 | 200 | 1001400 |
| 06 | දෙමළ උසස් | 49 | 100 | 4900 |
| 07 | සිංහල ශීර්ෂ ශබ්.කෝ. | 183 | 600 | 109800 |
| 08 | ත්‍රි භාෂා දෙමළ | 1373 | 150 | 205950 |
| 09 | English For public servants | 114 | 100 | 11400 |
| 10 | English for Better Communication. | 110 | 150 | 16500 |
| 11 | Practical English Basic | 258 | 125 | 32250 |
| 12 | Practical English advanced | 138 | 350 | 48300 |
| 13 | කළමනාකරණය | 181 | 115 | 20815 |
| 14 | සෞන්දර්ය අධ්‍යා. I | 35 | 75 | 2625 |
| 15 | සෞන්දර්ය අධ්‍යා. II | 30 | 60 | 1800 |
| 16 | බිම් මැනුම | 43 | 75 | 3225 |
| 17 | පරිසර විද්‍යාව | 35 | 150 | 5250 |
| 18 | Linguistics | 59 | 75 | 4425 |
| 19 | Communication Sta. | 69 | 60 | 4140 |
| 20 | Fine Art music | 43 | 75 | 3225 |
| 21 | Economics | 64 | 90 | 5760 |
| 22 | C.D | 34 | 250 | 8500 |
| 23 | සත්ත්ව විද්‍යාව | 27 | 150 | 4050 |
| 24 | පුරා විද්‍යාව | 34 | 100 | 3400 |
| මුළු වටිනාකම | | | | 4645170 |

| 2012 වර්ෂය තුළ පොත් මුද්‍රණය කිරීම | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශනය | ප්‍රමාණය | මුදල | මුද්‍රණ ආයතනය |
| | පුරා විද්‍යාව | 1000 | 65296 | සීසරා ප්‍රින්ට් වේ ප්‍රයිවට් වේ ප්‍රයිවට් ලිමිටඩ්, 110,පාගොඩ පාර,පිටකෝට්ටේ. |
| | සිංහලෙන් දෙමළ | 5000 | 765000 | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,පානලුව,පාදුක්ක |
| | කථන දෙමළ | 5000 | 605000 | තරංජී ප්‍රින්ටර්ස්,506,නාවින්න,රාජගිරිය. |
| | ලේඛන දෙමළ | 5000 | 535000 | තරංජී ප්‍රින්ටර්ස්,506,නාවින්න,රාජගිරිය |
| | අපි සිංහල, දෙමළ බස ඉගෙන ගනිමු | 50000 | 1866000 | ඩිසයින් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ්,23/1,පළමුවෙනි මාළිගාකන්ද පටුමඟ,කොළඹ 10 |
| | කථන දෙමළ | 9963 | 1171684.8 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,කොළඹ 08 |
| | භාෂණ දෙමළ | 2980 | 253657.6 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,කොළඹ 08 |
| | **මුළු එකතුව** | | **5261602.4** | |

# VII. පදමාලා සම්පාදන අංශය

රාජ්‍ය කළමනාරණ කටයුතු වලට අවශ්‍ය වන පාරිභාෂික පද භාෂාත්‍රයෙන් සම්පාදනය කිරීම, පරිවර්තකයින්ට අවශ්‍ය වන පාරිභාෂික පද රැස්කිරීම සහ නව පද ගෙතීම, දැනට අභාවිත පද වෙනුවට නව පද සම්පාදනය කිරීම මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. එමෙන්ම පාරිභාෂික පදමාලා දත්ත බැංකුවක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. පදමාලා සම්පාදන අංශය ප්‍රධාන කොටස් දෙකක් වශයෙන් ක්‍රියාත්මක වේ.

- ඉංග්‍රීසි - සිංහල පාරිභාෂික පදමාලා අංශය
- ඉංග්‍රීසි - දෙමළ පාරිභාෂික පදමාලා අංශය

## 2012 වසරේ ක්‍රියාකාරකම්

**ඉංග්‍රීසි - සිංහල පාරිභාෂික පදමාලා අංශය**

i. පහත සඳහන් ඉංග්‍රීසි- සිංහල පදමාලා 08 හි සම්පාදන කටයුතු නිමකර වෙබ් අඩවියේ පළකරනලදී. වාග් විද්‍යාව, නීතිය, දර්ශනය, සමාජ විද්‍යාව, පුස්තකාල හා විඥාපන විද්‍යාව, දේශපාලන විද්‍යාව, කලා ඉතිහාසය, ස්වස්ථතාව, කායික විද්‍යාව හා හෙද සේවය.

ii. උපදේශකවරුන් සමඟ ඒ ඒ විෂයට අදාල පද පිළිබඳ සාකච්ඡා කොට සිංහල පාඨ සම්මත කර ගනීමෙන් පසු පුරා විද්‍යාව පදමාලාවේ පිටපත් 1000 ක් 2012 වර්ෂය තුළදී මුද්‍රණය කළ අතර ඉන් පිටපත් 160 ක් අලෙවි කරන ලදී.

**ඉංග්‍රීසි - දෙමළ පාරිභාෂික පදමාලා අංශය**

i. ඉංග්‍රීසි - දෙමළ පාරිභාෂික පදමාලා සම්පාදන අංශය යටතේ පහත සඳහන් පදමාලා 09 අන්තර්ජාලයට මුදාහරින ලදී.
   - අධ්‍යාපන (A- K දක්වා වචන)
   - සාහිත්‍ය (A -Q දක්වා වචන)
   - ඉතිහාසය හා පුරාවිද්‍යාව (A-H දක්වා වචන)
   - භෞතිකවිද්‍යාව (A-Pදක්වා වචන)
   - ගණිතය (A - R දක්වා වචන )
   - සන්නිවේදනය (A-Zදක්වා වචන)
   - වාග් විද්‍යාව ( A - Z දක්වා වචන)
   - ආර්ථිකවිද්‍යාව (A-Z දක්වා වචන)
   - සෞන්දර්ය ( A - Z දක්වා වචන)

ii. උද්භිද විද්‍යාව, කෘෂිකර්මය, ඉංජිනේරු (රසායන හා කාර්මික) පදමාලා සකස් කරමින් පවතී.

## VIII. පුස්තකාලය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පුස්තකාලය අධි ශ්‍රේණියේ පුස්තකාලයකි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2002.05.03 වන දින මෙම පුස්තකාලය අධි ශ්‍රේණියට උසස් කරන ලදී.

### 2012 වසරේ ක්‍රියාකාරකම්.

i. පුස්තකාලයේ ඇති සියලු පොත් සමීක්ෂණය කිරීම.
ii. දැන්වීම් පුවරුව පවත්වාගෙන යාම.
iii. විශේෂාංග ලිපි එකතුන් පවත්වාගෙන යාම.
iv. පුවත්පත්වල පළවන භාෂා ලිපි එකතුවක් පවත්වාගෙන යාම.
v. දෙපාර්තමේන්තුව සම්බන්ධ පුවත්පත් ලිපි එක්රැස් කිරීම.
vi. පුස්තකාල සුචිය පරිග්‍රහණගත කිරීමට ආරම්භ කිරීම.

# 10. දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

## 10.1 ක්‍රියාකාරි සැලැස්ම - 2012

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| **01. අරමුණ : භාෂා ප්‍රවීණතාවය ලබාගැනිමට උපකාරි වන පහසුකම් සැලසීම - (I) ග්‍රන්ථ හා භාෂා අභ්‍යාස පොත් සැකසීම හා මුද්‍රණය කිරීම** | | | | | | | | |
| I. | ලේඛන දෙමළ පොත හා කථන දෙමළ පොත මුද්‍රණය කිරීම | පිටපත් 5000x2 | අප්‍රේල් | මිලියන 1.2 | - | - | මිලියන 1.2 | කොමසාරිස් |
| II. | භාෂණ සිංහල පොත මුද්‍රණය කිරීම. (සිංහල ප්‍රවීණතා මට්ටම් III සඳහා) | පිටපත් 5000 | මාර්තු | මිලියන 0.8 | - | - | මිලියන 0.8 | කොමසාරිස් |
| III. | කථන දෙමළ පොත සංශෝධනය කර මුද්‍රණය කිරීම | පිටපත් 5000 | මාර්තු - අගෝස්තු | - | මිලියන 2 | - | මිලියන 2 | කොමසාරිස් |
| IV. | දෙමළ ප්‍රවීණතා මට්ටම් I හා සිංහල ප්‍රවීණතා මට්ටම් I/II සඳහා අලුතින් පොත් 03ක් සම්පාදනය කර මුද්‍රණය කිරීම | පිටපත් 5000x3 | මාර්තු - දෙසැම්බර් | - | මිලියන 4 | | මිලියන 4 | කොමසාරිස් |

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| **01.** අරමුණ : **භාෂා ප්‍රවීණතාවය ලබාගැනීමට උපකාරි වන පහසුකම් සැලසීම -** (II) **පාරිභාෂික පදමාලා සම්පාදනය කිරීම.** | | | | | | | | |
| I. | පුරා විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව, කලමනාකරණය, අනුක ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව යන පදමාලා මුද්‍රණය කිරීම | පිටපත් 3000 විෂයයන් 06 | පෙබරවාරි | මිලියන 1.5 | - | - | මිලියන 1.5 | කොමසාරිස් |
| II. | ඉංග්‍රීසි- සිංහල පදමාලා සම්පාදන කටයුතු නිමකිරීම - (වාග් විද්‍යාව, නීතිය, දර්ශනය, සමාජ විද්‍යාව, පුස්තකාල විද්‍යාව හා විඥාපන විද්‍යාව, දේශපාලන විද්‍යාව, කලා ඉතිහාසය, ස්වස්ථතාව, කායික විද්‍යාව හා වෛද සේවය) | 08 | දෙසැම්බර් | | - | - | - | කොමසාරිස් |
| III. | ඉංග්‍රීසි - දෙමළ පදමාලා සම්පාදනය කර අවසන් කිරීම | විෂයයන් 10 | ජනවාරි - දෙසැම්බර් | | - | - | - | කොමසාරිස් |
| IV. | ත්‍රිභාෂා ශබ්ද කෝෂය මුද්‍රණය කර එළි දැක්වීම (III කාණ්ඩය) | | ජනවාරි- දෙසැම්බර් | | - | - | - | කොමසාරිස් |
| V. | e-dictionary අන්තර්ජාලයට මුදා හැරීම | | ජනවාරි | | - | - | - | කොමසාරිස් |
| VI. | පාරිභාෂික පදමාලා සකස් කිරීමේ ක්‍රියාවලිය සහ එහි ප්‍රගතිය සමාලෝචනය කර, ඉලෙක්ට්‍රොනික පාරිභාෂික පදමාලා සකස් කිරීම. | | ජනවාරි - දෙසැම්බර් | | - | NLP | - | |
| VII. | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ රජයේ නිලධාරින් දැනුවත් කිරීමේ ප්‍රකාශනයක් සැකසීම | | ජනවාරි - දෙසැම්බර් | | | - | | කොමසාරිස් |

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| 02. | **අරමුණ : භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම** | | | | | | | |
| I. | රාජ්‍ය භාෂා ප්‍රවීණතා I,II,III මට්ටම් සඳහා විභාග වසරට දෙවරක් පැවැත්වීම | අපේක්ෂකයින් 30000x2 | මාර්තු, ජූලි | මිලියන 5.5 | මිලියන 9.5 | - | මිලියන 15 | කොමසාරිස් |
| II. | ලිඛිත විභාගය සමත් වූ අයට වාචික පරීක්ෂණ පැවැත්වීම | 15000x2 | මැයි - සැප්තැම්බර් | - | මිලියන 2.5 | - | මිලියන 2.5 | කොමසාරිස් |
| III. | රාජ්‍ය භාෂා ප්‍රවීණතා සහතික පත්‍ර නිකුත් කිරීම | විභාගය සමත් වූ සියලු දෙනාට | අප්‍රේල් - දෙසැම්බර් | - | මිලියන 0.2 | - | මිලියන 0.2 | කොමසාරිස් |
| IV. | බාහිර ආයතන සඳහා විභාග පැවැත්වීම.<br>1. ජාතික ශිෂ්‍ය භට බලකාය රන්ටැඹේ - මූලික ඉංග්‍රීසි<br>2. කොත්මලේ-තාක්ෂණ පුහුණු ආයතනය-උසස් දෙමළ.<br>3. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, හෝමියෝපති- කාර්යක්ෂමතා කඩඉම.<br>4. ධීවර වරාය නීතිගත සංස්ථාව - දෙමළ III මට්ටම. විශේෂ විභාගය<br>5. දිස්ත්‍රික් වාණිජ කාර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලය - අනුරාධපුර - III මට්ටම.<br>6. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>7. භාෂා පරිවර්තන සහකාර - කාර්යක්ෂමතා කඩඉම් විභාගය | | මාර්තු, ජූලි | - | | - | | කොමසාරිස් |

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| **03. අරමුණ : රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශ්වයන් සඳහා භාෂා පරිවර්තන සේවාවන් සැපයීම.** | | | | | | | | |
| I. | භාෂා පරිවර්තන සංචිතය යාවත්කාලීන කිරීම | | ජනවාරි - පෙබරවාරි | මිලියන 0.3 | - | - | මිලියන 0.3 | කොමසාරිස් |
| II. | භාෂණ පරිවර්තන සංචිතය ස්ථාපිත කිරීම | 250 | ජනවාරි - මාර්තු | | - | - | | කොමසාරිස් |
| III. | භාෂා පරිවර්තක සහකාර පුහුණු වැඩසටහන් පැවැත්වීම | 94 දෙනෙකුට | ජනවාරි - දෙසැම්බර් | | - | - | | කොමසාරිස් |
| IV. | නවීන තාක්ෂණය උපයෝගි කර ගිනිමින් පරිවර්තන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම. (අන්තර්ජාලය ඔස්සේ භාෂා පරිවර්තන සිදුකිරීම) | | ජුනි - දෙසැම්බර් | - | - | NLP | | කොමසාරිස් |
| V. | තෝරාගත් භාෂා පරිවර්තකයන් සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබාදීම | | ජුනි - දෙසැම්බර් | - | - | NLP | | කොමසාරිස් |
| Vi. | භාෂා පරිවර්තනය පිළිබඳ ඉදිරි අවශ්‍යතා තක්සේරුව සඳහා අධ්‍යයනයක් කිරීම | | පෙබරවාරි - අප්‍රේල් | - | - | NLP | | කොමසාරිස් |
| VII. | එම අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරිම සඳහා වැඩමුළුවක් පැවැත්විම | | අප්‍රේල් | - | - | NLP | | කොමසාරිස් |
| VIII. | භාෂා පරිවර්තන කුසලතා වැඩිදියුණු කිරීමේ ඒකාබද්ධ කමිටු රැස්වීම | මාසිකව වාර 12ක් රැස්වීම | ජනවාරි - දෙසැම්බර් | - | - | NLP | | කොමසාරිස් |
| IX. | විදේශ අධ්‍යයන චාරිකා | | | - | - | NLP | | කොමසාරිස් |
| X. | භාෂා පරිවර්තන කාර්යාංශය පිහිටුවීම | | | - | - | NLP | | කොමසාරිස් |
| XI. | ක්ෂණික භාෂණ පරිවර්තන ඇමතුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම | | | - | - | NLP | | කොමසාරිස් |

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| **4. අරමුණ : ජාතික හා ජාත්‍යන්තර භාෂා හැකියාව ප්‍රවර්ධනය කිරීම.** | | | | | | | | |
| I. | සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා විදේශ භාෂා පාඨමාලා පැවැත්විම | ශිෂ්‍යයින් 1000 | ජනවාරි -ජුනි<br>ජුලි- දෙසැම්බර් | මිලියන 2 | - | - | මිලියන 2 | කොමසාරිස් |
| II. | පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය උසස් කිරීම සඳහා අන්තර්ජාල පහසුකම් සැලසීම | | | | - | - | | කොමසාරිස් |
| III. | දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයන් භාවිතා කරමින් ද්විභාෂා දැනුම වර්ධනය කිරීම.<br>i. උසස් දෙමළ පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලිය මඟින් අධ්‍යාපනික වැඩසටහනක් විකාශනය කිරීම<br>ii. රාජ්‍ය භාෂා ප්‍රවීණතා I මට්ටම සඳහා ආධාරක පාඨමාලා සංයුක්ත තැටියක් නිර්මාණය කිරීම.<br>iii. E-learning ක්‍රමයක් ස්ථාපිත කිරීම. | පිටපත් 10000 | ජනවාරි - මාර්තු<br>අප්‍රේල් - දෙසැම්බර්<br>මාර්තු - අගෝස්තු<br>මාර්තු-අගෝස්තු | | - | - | | කොමසාරිස් |
| Iv. | භාෂාව පිළබඳ විද්වත් සම්මන්ත්‍රණ 04ක් පැවැත්වීම. (සිංහල 2, දෙමළ 2) | සහභාගිත්වය 600 | පෙබරවාරි/මැයි/ අගෝස්තු/නොවැම්බර් | | - | - | | කොමසාරිස් |

| අනු අංකය | ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | කාල රාමුව | ඇස්තමේන්තුගත වියදම | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රජයේ අරමුදල් | | විදේශීය අරමුදල් | එකතුව | |
| | | | | දෙපාර්තමේන්තු | අමාත්‍යාංශ වැය | | | |
| **05.** | **අරමුණ : දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන** | | | | | | | |
| I. | දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන | 01 | ජනවාරි - පෙබරවාරි | මිලියන 5 | | | | කොමසාරිස් |

## 10.2 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන හා වියදම් පිළබඳ විස්තරය -2012

| ශීර්ෂ අංකය | විස්තරය | මුළු සැපයුම | මුළු වියදම | ශේෂය | මූල්‍යමය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 236-1-1-0-1001 | වැටුප් හා වේතන | 36605000.00 | 28042261.92 | 8562738.08 | 76.61 |
| 236-1-1-0-1002 | අතිකාල හා නිවාඩු දින දීමනා | 500000.00 | 283577.86 | 216422.14 | 56.72 |
| 236-1-1-0-1003 | වෙනත් දීමනා | 13895000.00 | 13890362.02 | 4637.98 | 99.97 |
| | පුද්ගලික දීමනා | 51000000.00 | 42216201.80 | 8783798.20 | 82.78 |
| 236-1-1-0-1101 | ගමන් වියදම් - දේශීය | 196000.00 | 195548.42 | 451.58 | 99.77 |
| 236-1-1-0-1102 | ගමන් වියදම් - විදේශීය | 403000.00 | 399560.00 | 3440.00 | 99.15 |
| 236-1-1-0-1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 980000.00 | 979976.33 | 23.67 | 100.00 |
| 236-1-1-0-1202 | ඉන්ධන | 490000.00 | 347811.00 | 142189.00 | 70.98 |
| 236-1-1-0-1203 | ආහාර හා නිල ඇඳුම් | 49000.00 | 48978.20 | 21.80 | 99.96 |
| 236-1-1-0-1301 | වාහන නඩත්තු | 212000.00 | 201763.00 | 10237.00 | 95.17 |
| 236-1-1-0-1302 | යන්ත්‍ර හා උපකරණ නඩත්තුව | 147000.00 | 70683.47 | 76316.53 | 48.08 |
